**පැෆ්රල්**

## පළාත් පාලන ඡන්ද විමසීම 2018

## ප්‍රථම මාධ්‍ය වාර්තාව

### පුංචි ඡන්දය නිරීක්ෂණයට පැෆ්රල් සූදානම්.

වසර දෙකහමාරකට වැඩිකාලයක් විවිධ හේතු ඉදිරිපත් කරමින් කල් දමන ලද පළාත් පාලන ඡන්ද විමසීම එකම දිනයක පැවැත්වීමට කටයුතු කිරීම පිළිබඳ ඒ හා සම්බන්ධ සියළු පාර්ශ්වයන්ට අපගේ ප්‍රසාදය පළ කරමු.

ප්‍රථම අදියරේ දී පළාත් පාලන ආයතන 93ක් සහ දෙවන අදියරේදී පළාත් පාලන ආයතන 248 ක් වශයෙන් පළාත් පාලන ආයතන 341 ක ඡන්ද විමසීම එළඹෙන පෙබරවාරි මස 10 වන දින පැවැත්වීමට නියමිත අතර ඒ සඳහා වන මූලික කටයුතු මැතිවරණ කොමිසමේ සභාපති වරයා ප්‍රමුඛ නිලධාරීන් විසින් මේ වන විට සිදුකරමින් පවතී.

මෙවර ඡන්ද විමසීමේදී ,

| | |
|---|---|
| මහනගර සභා | **24** |
| නගර සභා | **41** |
| ප්‍රාදේශීය සභා | **<u>276</u>** |
| එකතුව | **341** |

මෙම පළාත් පාලන ආයතන 341ක් සඳහා සභිකයන් 8346 ක් තෝරා පත්කර ගැනීමට නියමිත ය. සමානුපාතික සහ කේවල යන ක්‍රම දෙකම මිශ්‍ර කරමින් සැදූමලත් නව ක්‍රමයක් යටතේ පළාත් පාලන ආයතන සඳහා සභිකයන් තෝරාපත් කිරීම මෙවර ඡන්ද විමසීමේ විශේෂ ලක්ෂණයක් සේ අපි දකිමු.

### ඡන්ද නිරීක්ෂණයට 7000 කට අධික පිරිසක්.

පසුගිය මැතිවරණයන්හිදී නිරීක්ෂණ කටයුතු සිදුකළ ආකාරයටම නාම යෝජනා භාර දීම ආරම්භ කළ දින සිට පළාත් පාලන ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා පැෆ්රල් සූදානමින් සිටින අතර, පූර්ව මැතිවරණ සමයෙන් ආරම්භ වී පශ්චාත් කාලසීමාව දක්වා නිරීක්ෂණ කටයුතු සිදු කිරීමට අපේක්ෂිත ය.

විශේෂයෙන්, පූර්ව මැතිවරණ සමයේදී මාධ්‍යවේදීන්, සිවිල් සංවිධාන ක්‍රියාධරයින් වැනි පළපුරුදු දිගුකාලීන නිරීක්ෂකයින් හරහා සියළු දිස්ත්‍රික්කවලට අයත් සෑම මැතිවරණ කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි නිරීක්ෂණ කටයුතු සඳහා 160 කට අධික දිගුකාලීන නිරීක්ෂකයින් පිරිසක් අප විසින් පුහුණු කර මේ වන විට නිරීක්ෂණ කටයුතු සඳහා යොදවා ඇත. ඊට අමතරව අපගේ දිස්ත්‍රික් කාර්යාල හරහා ද ,

ප්‍රාදේශීය සම්බන්ධීකාරක වරුන් හරහා ද පූර්ව මැතිවරණ නිරීක්ෂණ කටයුතු ක්‍රියාත්මක වේ. එමෙන්ම පුහුණුවීම් අවසන් කරන 4000 ක පමණ නිරීක්ෂකයින් පිරිසක් මෙම නිරීක්ෂණයට එකතු වේ.

මැතිවරණ දිනයේදී දේශපාලන වශයෙන් සංවේදී හා පූර්ව අත්දැකීම් අනුව යම් සිදුවීම් ඇතිවේ යැයි අනුමාන කරනු ලබන සහ ඡන්ද ප්‍රතිඵල ගණනය කර ප්‍රකාශයට පත්කරනු ලබන ඡන්ද මධ්‍යස්ථාන සඳහා වැඩි සැළකිල්ලක් දක්වමින් ස්ථානගත නිරීක්ෂකයින් 4000 කට ආසන්න පිරිසක් යෙදවීමටත්, එමගින් ආවරණය නොවන ඡන්ද මධ්‍යස්ථාන සඳහා සෑම පළාත් පාලන ආයතනයක්ම ආවරණය වන පරිදි ජංගම නිරීක්ෂකයන් සිව්දෙනෙකුගෙන් සමන්විත නිරීක්ෂණ රථ 341 ක් යෙදවීමටත් අපේක්ෂිතය.

## තැපැල් ඡන්ද නිරීක්ෂණය සඳහා නිරීක්ෂකයින් දහසක්

පළාත් පාලන ඡන්ද විමසීමට අදාළ තැපැල් ඡන්ද විමසීම ජනවාරි මස 22, 25 සහ 26 යන තෙදින තුළ පැවැත්වීමට සැළසුම් කොට ඇති බැවින්, වැඩි ඡන්ද ප්‍රමාණයක් සහිත සහ යම්කිසි අක්‍රමිකතාවයක් හෝ ප්‍රචණ්ඩකාරී තත්ත්වයක් ඇතිවේ යැයි හැගෙන සිවිල් ආරක්ෂක කඳවුරු, හමුදා කඳවුරු, ගමනාගමන මණ්ඩල ඩිපෝ, අධ්‍යාපන කාර්යාල වැනි ඡන්ද මධ්‍යස්ථාන කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් එම මධ්‍යස්ථාන සඳහා නිරීක්ෂකයින් දහසක් (1000) යෙදවීමටත් අපි බලාපොරොත්තු වෙමු.

මේ අයුරින් පූර්ව නිරීක්ෂණ අවධියෙන් ආරම්භ වී පශ්චාත් වකවානුව දක්වා අපගේ නිරීක්ෂණ ක්‍රියාවලිය විහිදී යනු ඇත.

## පැෆ්රල් විශේෂ පැමිණිලි ඒකකය

මීට අමතරව ප්‍රථම අදියරේ නාමයෝජනා භාරදීම ආරම්භ කළ විගස අපගේ **විශේෂ පැමිණිලි ඒකකය** ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කළ අතර, මෙවර ඡන්ද විමසීම සම්බන්ධයෙන් ඕනෑම පුද්ගලයෙකුට සිදුවන අගතියක්, හිංසනයක්, අක්‍රමිකතාවයක් හෝ වෙනත් හේතුවක් සම්බන්ධයෙන් එකී පැමිණිලි ඒකකයට පැමිණිලි කිරීමට ඉඩ ප්‍රස්ථා සළසා ඇත.

විශේෂයෙන්ම ඉතිහාසයේ පළමු වතාවට කාන්තාවන් සඳහා 25% ක නියෝජිනයක් ලබාදී ඇති අතර මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයේදී කාන්තා අපේක්ෂිකාවන්ට එරෙහිව සිදු කරනු ලබන චරිත ඝාතන, මධ්‍යප්‍රචාර සහ සමාජ වෙබ් අඩවි උපයෝගී කර ගනිමින් සිදුකරනු ලබන විවිධ හිංසනයන් මෙන්ම ප්‍රචාරක කටයුතුවලට බාධාකාරී වන තත්ත්වයන් ගැන විශේෂයෙන්ම සොයා බැලීමට අපේක්ෂිත ය.

අපගේ විශේෂ පැමිණිලි ඒකකයෙහි තොරතුරු ඔබගේ පහසුව පිණිස පහත සඳහන් කරමු.

**පැෆ්රල් සංවිධානය -**

**නො 12/3, රොබට් ටෙරස් , රොබට් ගුණවර්ධන මාවත, කොළඹ 06.**

**පොදු දුරකථන - 011-2514441/2 / 011-3653656 (සිංහල මාධ්‍ය) 011-3653657 (දෙමළ මාධ්‍යය)**

**ඊමේල් - paffrel2018@gmail.com**

**ෆැක්ස් 011-2514443/ 011-2515011**

**හදිසි 071-4464258**

මේ වන විටත් මෙම පැමිණිලි ඒකකය වෙත පැමිණිලි ලැබෙමින් පවතින අතර එම පැමිණිලි සඳහා ක්ෂණිකව මැදිහත් වීම එම ඒකකය හරහා සිදුකරනු ලබයි.

## පැමිණිලි

පළාත් පාලන ආයතන 341 ක් සඳහා වූ ඡන්ද විමසීමට අදාළ නාමයෝජනා කැඳවා මේ වන විට දින 30 ක් පමණ ගතවී තිබේ. පැෆ්රල් සංවිධානය නාමයෝජනා ආරම්භ වූ දිනයේ සිට සිය නිරීක්ෂණ කටයුතු ආරම්භ කළ අතර මේ දක්වා කාලය තුළ පැමිණිලි 243 ලැබී ඇති අතර ඉන් 182 තහවුරු වූ පැමිණිලි වේ. මෙම පැමිණිලි අතර දේශපාලන අරමුණු ඇතිව සංග්‍රහ කිරීම දෙවැනි වන්නේ නීති විරෝධී ප්‍රචාරණ කටයුතුවලට පමණි. එවැනි සංග්‍රහ කිරීමේ පැමිණිලි 70 වාර්තා වී ඇති අතර ඒ යටතේ පාසැල් පොත්වල සිට මහන මැෂින් දක්වා විවිධ ගෘහ උපකරණ, කෘෂි උපකරණ, සිමෙන්ති, සෙවිලි තහඩු,රැකියා පෝරම, ණය කපාහැරීම් ආදී විවිධ සහන සහ ආධාර ලබාදීම් වාර්තා වේ. එමෙන්ම බොහෝ ප්‍රදේශවල කඩිනම් මාර්ග සංවර්ධනයන් පිළිබඳව ද පැමිණිලි ගලා එමින් පවතී.

මෙම පැමිණිලි කාට එරෙහිව ද යන්න හා විපතට පත්වූ පාර්ශ්වයන් පහත දක්වා ඇත.

| එරෙහිව ඇති පැමිණිලි | | පීඩාවට පත්වූ බවට පැමිණිලි | |
|---|---|---|---|
| පක්ෂය | පැමිණිලි සංඛ්‍යාව | පක්ෂය | පැමිණිලි සංඛාව |
| එ.ජා.ප. | 61 | එ.ජා.ප. | 05 |
| ශ්‍රී.නි.ප./ එ.ජ.නි.ස. | 60 | ශ්‍රී.නි.ප./ එ.ජ.නි.ස. | 08 |
| පො.ජ.පෙ. | 48 | පො.ජ.පෙ. | 03 |
| ජ.වි.පෙ. | 06 | ජ.වි.පෙ. | 02 |
| ස්වාධීන | 04 | ස්වාධීන | - |
| කම්කරු කොංග්‍රසය | 01 | කම්කරු කොංග්‍රසය | 01 |
| ටී.එන්.ඒ. | 02 | ටී.එන්.ඒ. | 01 |
| | | ඊ.පී.ඩී.පී. | 02 |
| | | අයි.ටී.ඒ. | 01 |

## මැතිවරණයේ කාන්තා භූමිකාව

ඡන්ද විමසීමට අදාළව පළමු පියවරේදීම දක්ෂ කාන්තාවන්ට , තරග කිරීමට නාමයෝජනා නොලැබෙන බවත්, බොහෝ පිරිස් සමානුපාතික ලැයිස්තුවට ඇතුලත් කර ඇති බවත් වාර්තා විය.

කෙසේ වෙතත් මේ දක්වා කාලය තුළ තරග කරන කාන්තාවන්ට එරෙහිව පැමිණිලි 10 වාර්තා වී ඇති අතර තරග කරන කාන්තා අපේක්ෂිකාවන් පීඩාවට පත්වූ අවස්ථා 06 ක් වාර්තා වී ඇත. ඒ අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂිකාවක් දූෂණය කිරීමට තැත් කිරීමක් ද වාර්තා වේ.

## මැතිවරණ කොමිසම හා පොලීසිය

මේ දක්වා කාලය තුළ මැතිවරණ කොමිසම හා පොලීසිය නීතිය ක්‍රියාවේ යොදවන්නටත්, මැතිවරණ අක්‍රමිකතා පාලනය කරන්නටත් යම් පමණකට සමන්විත වී ඇත. ඒ පිළිබඳ පැෆ්රල් සංවිධානයේ ප්‍රසාදය මැතිවරණ කොමිසම ප්‍රධාන නිලධාරීන්ටත්, පොලිස්පතිතුමා ප්‍රමුඛ පොලිස් නිලධාරීන්ටත් හිමිවිය යුතුය.

එසේ වුවත් මැතිවරණ දිනය අවසන් වන විට මේ තත්ත්වය වෙනස්විය හැකි බැවින් මෙම ආයතන දෙකෙහිම පූර්ණ අවධානය නිරන්තරයෙන් යොමුවිය යුතුය.

මැතිවරණයකදී, මැතිවරණ දූෂණ හෝ අක්‍රමිකතා වළක්වා ගැනීම සඳහා ඡන්දය භාවිතා කිරීමේදී වලංගු අනන්‍යතා පත්‍රයක් අනිවාර්යය වීම 2006 වර්ෂයේදී පැෆ්රල් සංවිධානය ඇතුළු අනෙකුත් පාර්ශ්වයන්ගේ මැදිහත්වීම හරහා සිදු වූ බැවින් මැතිවරණ කොමිසමේ සභාපතිවරයා විසින් දක්වා ඇති වලංගු අනන්‍යතා පත්‍රවලින් එකක් හෝ ඔබ සතුව නොමැතිනම් ඡන්දය භාවිත කිරීම සඳහා මැතිවරණ කොමිසම මගින් නිකුත් කරනු ලබන තාවකාලික හැඳුනුම්පතක් ලබාගත හැකි අතර, එම හැඳුනුම්පත් මේ දිනවල නිකුත් කරන බැවින් ඒ සඳහා ඔබේ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හමුවීමට කටයුතු කරන ලෙස අවධාරණය කරන අතර මැතිවරණය ආසන්නයේදී ඒ පිළිබඳ මැසිවිලි නැගීමෙන් පළක් නොවන බැවින් , ඔබගේ ඡන්ද අයිතිය සුරක්ෂිත කර ගැනීමට අද අදම ක්‍රියාත්මක වන මෙන් අප තවදුරටත් ඔබෙන් ඉල්ලා සිටිමු.

පළාත් පාලන ඡන්ද විමසීම නිදහස් හා සාධාරණ අන්දමින් සිදු කිරීමේ වගකීම, මැතිවරණ කොමිසමට , පොලිස් කොමිසමට පමණක් තනිව කළහැකි කර්තව්‍යයක් නොවන බැවින්, දේශපාලන පක්ෂ ස්වාධීන කණ්ඩායම් මෙන්ම පුරවැසියන් වන අප කාගේත් යුතුකමක් මෙන්ම වගකීමක් සේ සළකා කටයුතු කිරීමට වගබලා ගන්නා මෙන් පුරවැසියන් වන ඔබගෙන් අප ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.